# පුංචි මලිති



අකිත්මි දිසානායක

# පුංචි මලිති

කතෘ - අකිත්මි දිසානායක

ISBN අංකය - 978-624-206-856-5

කෘතිය පල කරන දිනය - 2023.12.05

කතෘගේ වෙනත් කෘති - පුංචි දියකිඳුරිය

# පිදුම

මෙම පොත ලිවීමට මා හට උදව් කළ මාගේ
ආදරණීය ගුරුතුමියටත්, මාගේ දෙමව්පියන්ටත්
මෙම පොත ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන් ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීම් සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසල් කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පති

මහමායා බාලිකා විද්‍යාලය මහනුවර

2023.11.01

එදා නිවාඩු දවසක් අප්පච්චි ඇහැරුනේ ටිකක් වෙලා ගිහින් හැබැයි වෙනදාට නිවාඩු දවස්වලට උදේට ගෙදර ඇතුළේ වගේ ම එළියේ ඇහෙන සද්දේ අද නැහැ අප්පච්චි හිමින් කුස්සියට ගිහින් මොකද අද ගෙදර සද්දයක් නැත්තේ කියලා අම්මගෙන් ඇහුවා.

"දුවේ... දුවේ..."

අම්මා කතා කළා.

ඒත් කිසිම සද්දයක් නැහැ.

"එහෙනම් කාමරේට වෙලා පාඩම් කරනවා ඇති"

අම්මා කිව්වා.

මලිති ඉගෙන ගන්නේ හතර වසරේ එයාට මල්ලි

කෙනෙක් ඉන්නවා.

මලිති දෙමාපියන්ට කීකරු ඉගෙන ගන්නත් දක්ෂ

හොඳ දරුවෙක් හැබැයි මේ මලිති කිසිම දෙයකට

ඉදිරිපත් වෙන්නේ නැහැ එයා හිතනවා එයාට නටන්න ගයන්න වගේ ම නිර්මාණ කරන්න බෑ කියලා. එහෙම හිතලා  එයා කිසි දේකට යන්නේ නැහැ.

“අම්මේ අම්මේ” මලිතිගේ මල්ලි දුවගෙන ආවා.

“අක්කා සෙල්ලම් කරන්න එන්නේ නැහැ අම්මේ” මල්ලි දුකින් කිව්වා.

“ඇයි මේ ළමයාට මොනවා වෙලාද?’’ අප්පච්චි අම්මගෙන් ඇසුවා.

“මේ දවස්වල ඉස්කෝලේ නිර්මාණ තරඟයක් වගේ ම නැටුම් ගැයුම් ඉදිරිපත් කරන්නත් අවස්ථාව උදා

වෙලා තියෙනවා ඒත් මලිති ඒවාට ඉදිරිපත් වෙන්න බයයි ඒකයි එයා මේ දවස්වල දුකෙන් ඉන්නේ”

අම්මා දුකින් කිව්වා.

“ඒත් අපි මේකට මොකක් හරි කරන්න ඕන නේද?”

“අපි තාත්තට කියලා බලමු මලිතිගේ අදහස් වෙනස් කරන්න පුළුවන්ද කියලා.”

“මලිති සීයාට හරි ආදරෙයිනේ සීයා කියන දේ සමහරවිට අහයි.”

ඉතින් ඔන්න ටිකක් දවල් වෙලා මලිතිගේ සීයා එයාලගේ ගෙදර ආවා ඒත් මලිතිගේ සද්දයක් වත් නැහැ සීයාට වගේ ම අම්මාටයි තාත්තටයි හරිම

පුදුමයි. වෙනදාට සීයා දැක්කහම දුවගෙන එන මලිති අද හරිම නිශ්ශබ්දයි.

ඉතින් සීයයි අම්මයි තාත්තයි මලිතිගෙන් මේ ගැන ඇහුවා.

එයා උත්තර දුන්නෙත් නැහැ දුකෙන් බලාගෙන හිටියා විතරයි.ඇස් වල කඳුලු පිරිලා.

එදා මලිතිගේ සීයා එයාලගේ ගෙදර නතර වුණා. හවස් වරුවේ සීයා මිදුලේ ඇවිද ඇවිද ඉන්නකොට මලිති බංකුවක් උඩට වෙලා කල්පනා කරමින් ඉන්නවා දැක්කා.

“මලිති දුවේ දුවට සනීප නැද්ද සීයා ඇසුවා.”

“නෑ නෑ සීයේ කියමින් මලිති අඬන්න පටන් ගත්තා.”



පස්සේ සීයාට විස්තරය කිව්වා ඉතින් සීයටත් හරිම දුකයි.

සීයා කල්පනා කළා මේකට මොකක්ද කරන්න ඕන කියලා.

පහුවෙනිදා සීයා මලිතිගේ පාසල් ගුරුතුමිය හමුවෙන්න ගියා. පස්සේ.....

සීයා මලිතිලාගේ ගෙදර ටික දවසක් ඉන්න තීරණය කළා.

ගුරුතුමිය කියල දුන්න විදිහට සීයා මලිතිට ලස්සන කතන්දර කියල දුන්නා.ඒ වගේම එක් එක් අයගේ ජීවිත කතා සහ එයලා අභියෝග වලට මුහුණ දුන්න විදිහත් මලිතිට කියලා දුන්නා.

ඒවායෙන් මලිති ගොඩක් දේවල් ඉගෙන ගත්තා.

සීයා මලිති එක්ක එකතුවෙලා සින්දු කිව්වා.

ඒ විතරක්ද තාත්තාට කියලා බඩු ගෙන්න ගෙන එක එක නිර්මාණ කළා .මේ හැම දේකම පිටිපස්සෙ ඉඳගෙන අම්මයි,තාත්තයි, ගුරුතුමියි උදව් කළා.ඉතින් දැන් මලිතිටත් ටික ටික තේරුණා තමන් තුළ එම දක්ෂතා තියෙනවා කියලා.

ඇයට දැන් හරිම සතුටුයි.

ඊට පස්සේ ඇය සංගීතය, නැටුම් ඉගෙන ගන්නත් පටන් ගත්තා.



හොඳින් සින්දු කියන්න මෙන්ම නටන්නත් පුරුදු වෙලා පාසලේ දී ඒවාට හරි අපූරුවට ඉදිරිපත් කළා හැමදේකටම ඉදිරිපත් වෙන්න ඇයට ආත්ම ශක්තියක් ඇතිවුණා. ඇයට ඒවාගෙන් ජයග්‍රහණ හිමි වුණා.

දෙමාපියන්ට, යාළුවන්ට වගේම ගුරුතුමියටත් හරිම සතුටුයි.

හැබැයි වැඩියෙන්ම සතුටු වුණේ මලිතිගේ සීයා.

”ඒකනේ.. දුවේ බැහැ කියලා දෙයක් නෑ. උත්සාහ කලොත් අපිට ඕනෑම දෙයක් ජයග්‍රහණය කරන්න පුළුවන්” සීයා මලිතිගේ ඔළුව අතගාලා ආදරෙන් පැවසුවා.

මගේ හොඳ සීයා මලිති ආදරෙන් සීයා ව තුරුළු කරගත්තා.

“පුංචි යාළුවනේ ඔයාලා මම හිටියා වගේ කිසිම දේකට ඉදිරිපත් වෙන්නේ නැතුව නම් ඉන්න එපා. තමන්ට කරන්න පුලුවන් මොනවද කියලා හොයාගෙන ඉදිරියටම යන්න.හොඳින් ඉගෙන ගන්න ගමන් බාහිර කටයුතු වලින් ඉදිරියට ගිහිල්ලා කුසලතා හදාගන්නත් ඕන.”

ජයග්‍රාහී සම්මානයක් ඇතැතිව පාසලේ වේදිකාවේ දී ඇයආඩම්බරයෙන් පැවසුවා.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවතනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම. ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතිකතලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරියක වීමට ශක්තිය ලැබේවායි පතමු.

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට
යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01